# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

සිංහල I
Sinhala I

71 S I

කාලය : පැය තුනයි
Time : Three hours

**සැලකිය යුතුයි:-**

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) සහ (උ) උද්ධෘත හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න.(මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරම යොදා ගන්න.)

(අ) ඉක්බිති මද ඇසිල්ලකින් ලබන ලද ආස්වාද ඇති ඒ බ්‍රාක්මණ තෙම බලවත් රෝගයකින් පීඩිත වූ පුරුෂයකු මෙන් කෙදිරි ගගා රජගෙන් නික්ම තමා වසන ගෙට ගොස් යහළුමිත්‍රයන් කැඳවා ඔවුන්ට කියනුයේ එම්බා යහළුවෙනි, යම් කිසි මිත්‍ර කෙනෙක් ආපදාර්ථයක් පැමිණි කල්හි තමන්ගේ යහළුවන් අත්නොහැර සමීපයට එල්බ සිටිත් ද දුක් සැප දෙක් හී සම වූ සිත් ඇත්තා හු ද මිත්‍රයන්ගේ යහපත් ගුණය ප්‍රකාශ කෙරෙද් ද ඇසූ කෙනෙකුන් නින්දා කටයුතු නුගුණයක් ඇත සඟවා වෙසෙද් ද කළමනා කටයුත්තෙහි යොදද්ද නොකළමනා දෙය වළකද්ද මිත්‍රයෝනම් ඔහුමය නැයෝ නමුත් ඔහුමය, කාමයෙහි ඉතා ලොල් වූ ස්වර්ණ තිලකා නම් ස්ත්‍රීයක් තමාගේ නිල් නුවන් නැමති තද ශර ප්‍රහාරයෙන් මාගේ සිත් නැමති ශරිරය විද කඩ කඩ කොටපුව ඇගේ මුඛ නැමති රත් පියුමෙහි ඇලුම් කළාවූ මාගේ නේත්‍ර නැමති භෘංගයෝ දෙදෙන මඳකුත් මා සිහි නොකොට ස්වර්ණ තිලකාවගේ මුඛ නැමති පද්මයෙහි සිත් අලවා වෙසෙති.

i. බ්‍රාහ්මණ තෙම මෙසේ දුර්වලත්වයට පත් වූයේ ඇයි?
ii. මෙහි සඳහන් මිත්‍රයෝ නම් කවුර හු ද?
iii. "තමාගේ නිල් නුවන් නැමති තද ශර ප්‍රහාරයෙන් මාගේ සිත් නැමති ශරීරය විද කඩ කඩ කොටපුව" යන්නෙ හි අදහස ලිහිල් බසින් ලියන්න
iv. ආපදාර්ථයක් යන්නට කෙටි විවරණයක් සපයන්න.

(ලකුණු 04)

(ආ) සිටු දුවණියෝත් තුන් විටක් පැදකුණු කොටලා සතර තැනක සිට වැඳලා සිට "ස්වාමීනි", මේ කෙළවර දැක්මය මෙවක් පටන් මුඹවහන්සේගේ මා දැක්මකුත් මාගේ මුඹවහන්සේ දැක්මකුත් නැත' යි කියාලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙන පියා පිටිපස්සේ සිටත් සිටගෙන පියා කුමක් දෝ හෝයි සිතමින් ගල්කෙළවර පමාව සිටිය හු තුමු පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන ඌගේ කාය බල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායා බලය මහත් හෙයින් ගල්මුදුනෙන් දැමූහ. හෙතෙම කඩ කඩව ගලින් හී මිය තෙමේම බිලිවිය. සොර පව්වේ වසන දේවතාවානෝ වුන් දෙන්නාගේ ම කටයුත්ත දැක හැම තැනකදීම පිරිමින් උපදෙස් දනිතී නැත, සමහා තැනක ගෑණු ද උපදෙස් දනිති කිවූ ය.

i. සිටුදුවණියන් මෙසේ පැදකුණු කිරීමට හේතුව කුමක්ද?
ii. සොර පව්වේ වසන දේවතාණෝ ප්‍රකාශ කළේ කුමක්ද?
iii. එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතෙකින් පිටිමුල අල්වාගෙන වුගේ කාය බල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායා බලයමහත් හෙයින් ගල්මුදුනෙන් දැමූහ. යන උද්ධෘතයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.
iv. පැදකුණු යන පදයට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඇ) තවද දුෂ්ට වූ මහරජ තාගේ ප්‍රජාපතී තොම තමන් දරුවන් නොදැක නිරා වදිව'යි යනාදීන් ඇවිලි අවඅවා අඩන්නට පටන් ගත් හ. රජ්ජුරුවෝ ද මෙසේ අඩන්නි ය.අස්වසන්නා වූ මහා බෝසත්හු විත් කා අඩන වේලෙහි මා නම කියා හැඩූ හෙයින් නම දැන ද ගින්නෙර මල් බඳු ඇස් ඇති මනා වූ හාවභාව ලීලා විලාස ඇති චන්ද්‍රිකාව තෝ ගින්නෙර තෝ සෝක නො කරව, ඉදින් තී කැමති වී නම් මට බිරින්ද කොට සොළොස් දහසක් පුරංගනාවන් මධ්‍යයෙහි රාජ කුලෙහි ප්‍රසිද්ධව වයි කීහ. එපවත් අසා චන්ද්‍රිකා තොම අවලස්සන තෝ මා නිසා නිරපරාධ වූ මා ගේ සමනා මැරීද? ඔහු කෙරෙහි ස්නෙහයෙන් අඩා මියන පමණක් මුත් තොපට පාදපරිචාරිකා වීමෙක් ඒකාන්තයෙන්ම නොවේයි තද කොට කිව .

i. කිඳුරිය රජතුමාට ශාපකරන්නේ කෙසේද?
ii. රජතුමා කිඳුරියට කරන යෝජනාව කුමක්ද?
iii. "ගින්තෙර මල් බඳු ඇස් ඇති මනා වූ හාවභාව ලීලා විලාස ඇති චන්ද්‍රිකාව තෝ සෝක නො කරව" උද්ධෘතයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.
iv. "නිරාවදීව" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ඇ) ජීවකයෝ එ පවත් අසා ශාස්ත්‍රය නම් බාලය වැඩිමහලු යැයි යන බැවහාර නැත්තේය නුවණ නම් වයස් නිසා ඇතිවන දෙයක් නොවේ වෙයි. මා දත් ශාස්ත්‍රය මුත් මාගේ වයසින් තමන් වහන්සේට ප්‍රයෝජන කිම්ද? තෙල රුජාව සන්සිඳුවා මිස නොයෙමි. වැළිඳු ධන හානියකුත් නොකෙරෙමි. මාගේ ශාස්ත්‍ර බල දක්වා මුත් කිසිවක් නොගනිමි. යි කියා යැවූහ. සිටු දේවී ජීවකයන්ගේ නිර්භීත වූ සාර භාර තෙපුල් අසා ඉතා සතුටුව පෙරගමන් කොට ගොස් ජීවකයන් කැඳවා සාමීචි කතා කොට බත් බුලත් දී සතපා හිඳනා අසුන් දී "පුතණුවනි, සත් හවුරුද්දක් මුළුල්ලෙහි නින්දක් නොලද්දා වූ මා එක දවසක් නිදවාපිය නොහෙනුයේ දැ'යි විචාළිහ.ජීවකයෝ "ඇසිල්ලකින් සන්සිඳුවාලමි" යි පතක් පමණ ගිතෙල් වුව මැනවයි කියා ගෙන්වා ගෙන තමන් අතින් නොයෙක් ඖෂධ ලා තෙල් සිද නිවා නශ්‍යා කළහ.

i. ජීවකයෝ මෙසේ ප්‍රකාශ කරන්නට හේතුව කුමක්ද?
ii. සිටුදේවියගේ විශ්වාසය තහවුරු වූයේ කෙසේද?
iii. "ශාස්ත්‍රය නම් බාලය වැඩිමහලු යැයි යන බැව හැර නැත්තේය නුවණ නම් වයස් නිසා ඇතිවන දෙයක් නොවේ වෙයි" උද්ධෘතයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.
iv. "පතක්" යන්නට අර්ථ විවරණ සපයනන්න.

(ලකුණු 04)

(ඉ)

පන්සිළු වීනා නද පසු බැස්වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස්වූ
නන් දන කැන් දුටුවද බිය සිස්වූ
මින් රළ වුත් ගං වෙරළට රුස්වූ

වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පිය පත් විදමිනි
පුරඹර වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැනවූ වැනි

i. ගං වෙරළේ ඇති වූ අසිරිය කුමක්ද?
ii. පන්සිළු පසුබැමට බලපෑවේ කුමක්ද?
iii. අහසේ දැකගත හැකි සුන්දර දර්ශනය කුමක්ද?
iv. "පන්සිළු" යන්න කෙටි විවරණයක් සපයන්න.

(ලකුණු 04)

(උ) පහත සඳහන් උද්ධෘත හතරකට අදාල අවස්ථා සම්බන්ධය ලියා දක්වන්න.

i. "බිය නොවන් මියුලැස සිත ඔබේ සනසමි"
ii. "යහළු ජරාමරණ දෙදෙනාගෙන් පළමු වීමෙහි විනාසයෙක් නැත"
iii. "එබඳු නපුරු අදහස් ඇති මිනිසකු දැනදැන මගේ ගෙට වැද්ද නොදෙමි"
iv. "ආ... මේ පින්තූරේ ටී.වී. එකෙත් පෙන්නුවා"
v. "ඒවා තමුසේ බලාගන්නවා මට කියන්න එපා"
vi. "නෑ වෙද මහත්තයෝ මන් දන්නෙ නෑ මන් අහලා තියනවා"
vii. "එබැවින් යහළුව මා බඩසා ය. මා බත් කා පියන තෙක් මදක් බලව"

(ලකුණු -3×4=12)

(ඌ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයෙහි සහ භාෂා ව්‍යවහරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මල් ගොමු ගුමුගුමු ගන්වන්නී
මී වදවලැ පැණි පුරවන්නී
කුරුලු සරින් කන් පිනවන්නී
මුළු ලොව උයනක් කරවන්නී

ජම්බු ගහට රත පොරවන්නී
බක් මී ගහ කහ අන්දන්නී
අඹ දළු ළා රත තවරන්නී
ලෝ කත විසිතුරු කැරැ-ලන්නී

එරබදු පැහැයෙන් රත දුලවන්නී
නා ගස් සුවඳින් බැඳ-ලන්නී
විලේ නෙළුම් මල් පොබයන්නී
නෙත ගිය ගිය අත පණවන්නී

ගමේ මැ පුහුලන් ඉදවන්නී
සොරුන් බවට වවුලන් ලන්නී
නෙතැන වවුලු පළවල් දෙන්නී
ගම් දරුවන් හට වැඩ දෙන්නී

මල් සර හට හී සපයන්නී
යොවුනන්සිත් ඉන් බැඳ-ලන්නී
දෙක දෙක එක් කැරැ ඈඳන්නී
නොමිලේ කපුකම් කරවන්නි

වෙන් වූ වන් සිත කලඹන්නි
පැරැණි තරහා හැම යට ලන්නි
ආයෙත් එකමුතු කරවන්නි
පවුල් අවුල් විසඳා-ලන්නී

කොල්ලන් කෙල්ලන් පොබයන්නි
මහලු සිතෙත් කෙළි රිසි ලන්නී
ගෙයි ගෙයි බක් වෙස් ගන්වන්නී
අවුරුදු කිරිබත උයවන්නී

දස දෙස සුවඳින් බැඳෑ-ලන්නී
ගතට සිතට නව පණ දෙන්නී
කුඹුරට ආසිරි සලසන්නී
රට වැට සොම් නස ගෙනයන්නී

සිසිර කුමාරි පස්සට ලන්නී
ගිම් කුමාරි පෙරටු වැ එන්නී
දිනිසුරු කුමරිට අත දෙන්නී
ලොවැටම මඟුලක් සලසන්නී

(ලකුණු 12)

2.

i. දඹදෙණි යුගයේ සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍ය ප්‍රබෝධය හා එහි සුවිශේෂතා පිළබඳ විමර්ශනය කරන්න.

ii. ගතානුගතික ලේඛන කලාවෙන් මිදුණු ස්වාධීන වූත් /සුවිශේෂී වූත් ලේඛන ශෛලියක් අනුගමනය කරමින් ධර්මසේන හිමියෝ සිය ප්‍රතිභාපූර්ණත්වය ප්‍රකට කරන්නේ කෙසේදැයි නිදසුන් සහිතව විමසන්න.

(ලකුණු 15යි.)

**නැතහොත්**

සාම්ප්‍රදායික රාමුවකින් වටවූ කතා කලාවක් තුළ ගොඩ නැගුණු ගද්‍ය සාහිත්‍ය නිර්මාණයක් වුව ද පුද්ගල චරිත සංවර්ධනයට ගැලපෙන කාලෝචිත කතා රචනා කිරීමට ජාතක කතාකරුවා සනමත්වී ඇති ආකාරය නිදසුන් සහිතව විමසන්න.

(ලකුණු 15යි.)

3. කතා කීමේ සරලත්වයත් අවස්ථා සිද්ධි නිරූපනයේදී දක්වන සුවිශේෂී දක්ෂතාවයත් නිසා පූජාවලිය පාඨක හදවත ඇද බැද ගන්නට සමත් වේ . උක්ත කියමන නිදසුන් සහිතව විභාග කරන්න.

(ලකුණු 15යි.)

4. ගුත්තිල කාව්‍ය කතුවරයා සිය අරමුණ ඉටුකර ගැනීමෙහිලා ජාතක කතාවේ ඇතුළත් චරිත ගොඩනන්වා ඇති ආකාරය විමසන්න.

(ලකුණු 15යි.)

5. එදා ජනයා ගත කළ කටුක ජීවිතයේ විඳි අනේක විද දුක්කම්කටොළු බැද්දේගම නවකතාකරුවා හෙළි කරන්නේ කෙසේදැයි විමසන්න.

(ලකුණු 15යි.)

6. කෙටිකතාකරුවා මිනිස් ජීවිතවල ඇති බැදීම් ස්වභාවයන්හී විවිධත්වය විෂද කරන්නට සමත් වී ඇත්තේ කෙසේදැයි විමසන්න.

(ලකුණු 15යි.)

7. "නූතන කවීන් සැමවිටම සොබාදහමේ චමත්කාරජනක අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ දරා ඇත" උදාහරණ සහිතව උක්ත කියමන විභාග කරන්න.

(ලකුණු 15යි.)

8. පැරණි භාරතීය බමුණු සමාජයේ පැවති සාම්ප්‍රදායික මතිමතාන්තරවල දුර්වලත්වය ප්‍රකාශ කිරීමටත්, සැම චරිතයක් කෙරෙහිම සාධාරණ දෘෂ්ටි කෝණයක් හෙළීමටත්, නාට්‍යකරුවා සමත් වී ඇත්තේ කෙසේදැයි “පේමතෝ ජායතී සොකෝ” නාට්‍ය පෙළ ඇසුරෙන් විමසන්න.

(ලකුණු 15යි.)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2020
# General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2020

සිංහල II
Sinhala II

71 | S | II

කාලය : පැය තුනයි
Time : Three hours

වඩාත් ගැළපෙන පිළිතුරට හිමි අංකය තෝරා ලියන්න.

1.කණ්ඨජ අක්ෂර පමණක් අන්තර්ගත වර්ණය තෝරන්න.

1.ක, ඛ, ග, ජ, ඩ, න
2.ක, ඛ, ග, ඝ, න, ඟ
3.ක, ඛ, ග, ඝ, ම, ඹ
4.ට, ඨ, ඩ, ග, ඝ, ඟ
5.ක, ඛ, ග, ඝ, ඞ, ඟ

(........ )

2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. විනිශ්චය, ධර්මිෂ්ඨ, සංඝායනා, ප්‍රස්ථාර, දෘශ්‍යමාන
2. විනිශ්චය, ධර්මිෂ්ඨ, සංගායනා, ප්‍රස්තාර, දෘශ්‍යමාන
3. විනිස්චය, ධර්මිෂ්ඨ, සංගායනා, ප්‍රස්ථාර, දෘස්‍යමාන
4. විනිශ්චය, ධර්මිෂ්ට, සංගායනා, ප්‍රස්තාර, දෘශ්‍යමාන
5. විනිශ්චය, ධර්මිෂ්ඨ, සංගායනා, ප්‍රශ්තාර, දෘස්‍යමාන

(........ )

3.අකාරාදී පිළිවෙළ නිවැරදිව ලියා ඇති පේළිය තෝරන්න.

1. කළුතර, කලවාන, කැස්බෑව, කටුවාපිටිය
2. බිජිං, ටෝකියෝ, පර්ත්,මැනිලා
3. අක්කර පහ, කරුමක්කාරයෝ, චරිත තුනක්, තුම්මංහන්දිය
4. අරළු, නෙල්ලි, රසකිඳ, බුළු
5. ගිරා, හංස, සැළලිහිණි, පරෙවි

(........ )

4.පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. ඓ ස්වරය සංයුක්ත අක්ෂරයක් නොවේ.
2. ඓ ස්වරය නියෝජනය කරන පිලි සංකේතය “ ෛ” යි.
3. ඓ ස්වරය යෙදෙන සෑම පදයකම “ ෛ” යෙදේ.
4. ඓ දීර්ඝ ස්වරයකි.
5. සිංහල වචනවල යංශයට පරවද ඓ අක්ෂරය යෙදේ. (........ )

5.එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. කනිෂ්ඨ විදුහල - අමාත්‍ය මඬුල්ල - ධර්ම දේශනය - ගගන යාත්‍රාව
2. සමුද්‍ර ඛාදනය - විදෙස් ප්‍රවෘත්ති - මාතෘ භූමිය - සුබ ප්‍රාර්ථනා
3. මව් භාෂාව - ශිෂ්‍ය සබඳතා - පුවත් පත් - රන් බිම
4. ස්වර්ණ භූමි - නැණ සයුර - පුවත් විමසුම - ආඥා චක්‍රය
5. සම්ප්‍රදාන විභක්ති - සොබා ධර්මය - විභක්ති ප්‍රත්‍ය - මිශ්‍ර කිරිය (........ )

6.තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1.භාෂාව, මාතෘ, පුස්තක, භූමි 2. ඔළුව, ළද, කකුල, කරඹ

3.පරිසර, තිරසර, පරිවාර, සුකුමාර 4.පාලක, එල, පණ, ප්‍රදාන

5.චන්දන, විකල්ප, කල්ප, සුකුමාර (........ )

7 .තත්භව වචන පමණක් අන්තර්ගත වර්ණය තෝරන්න.

1. මිනිස්, තෙවළා, සිරිපා, ධර්ම 2. සිරුර, සක්විති, පිළිරුව්, පෙදෙස

3. සහශ්‍ර, අබිමන, දසුන, පිවිසුම 4. පැදකුණු, ශීලය, පිළිමය, මිතුර

5. සඳුන්, ප්‍රමාණ, පසිඳු, පැවිදි (........ )

8 අව්‍ය, විභක්ති,විශේෂණ, අන්‍යාර්ථ සමාසවලට අයත් පද පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

1. අප්‍රමාණ, මුතුදත්, වැසිජලය, දිගැස 2. මුතුදත්,අප්‍රමාණ, වැසිජලය, දිගැස

3. දිගැස, වැසිජලය,මුතුදත්, අප්‍රමාණ 4. වැසිජලය, දිගැස, මුතුදත්, අප්‍රමාණ,

5. අප්‍රමාණ, වැසිජලය, මුතුදත්, දිගැස (........ )

9. කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1.රැකුම,බැල්ම, කියුම, දෙඩුම 2.ලියන්නා, කියන්නා, බලන්නා, නටන්නා

3. පිවිසි, පිහිටි,මෙහෙසි, රැකි 4.ගෑ, පෑ, කෑ, නෑ

5. නැටූ, ගෙතූ, බැලූ, කැපූ

(........ )

10. ඉරි ඇදි පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

a. ආගන්තුකයා දරුවා <u>හඬවයි.</u>
b. <u>නරඹ</u> යනෙන වෙළඳුන් ඔරු පාරුවෙනි.
c. සැදෑ කළුවර කුර <u>ගගා</u> විත්
d. තිරිසන් <u>වුණෝතින්</u> කිසි හව් හරණ නැති

1.විධි ක්‍රියා,මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

2.ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

3.ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා මිශ්‍ර ක්‍රියා

4. ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

5.විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා (........ )

11.තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1.උදාරතම,පාපතර,ශ්‍රේෂ්ඨතම,මිහිරිතර

2.හැකියා, ළැදියා, බරියා, ඇඬියා

3.මූලික, ව්‍යාපාරික, රසායනික, ශ්‍රෝත්‍රික

4.පාපීය, ස්වදේශීය, ධරණීය,කාර්යාලීය

5.සුහදතා,ජනතා, දුබලතා, අවශ්‍යතා (........ )

12.උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

1.නිසල, නිස්සාර, නිෂ්ඵල, නිර්මල

2.සද්භාව, සම්මාන, සත්පුරුෂ, සඵල

3.පසක්, ප්‍රතිලාභ, ප්‍රත්‍යුපකාර, පටිපාටිය

4. උපභාෂා,උපකුලපති,පරිශුද්ධ, අත්‍යවශ්‍ය

5.ප්‍රත්‍යක්ෂ, නිරනුමාන, නොලසා, අධිබලැති (........ )

13.නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1.නිතර,විතර,දුබල,නිති

2.විසින්,කෙරෙන්,මත,ගේ

3.සමඟ, හා, කැටුව, එක්ක

4.පිණිස, තකා, සඳහා, වස්

5.මුත්, මිස, පවා, විනා (........ )

14.මහසෙන් නිරිඳු ඇළදොළගංගා වලින් නිසි ප්‍රයෝජන ගත් ලක්බිම විසූ ශ්‍රේෂ්ඨතම නරවරයෙකි. මෙහි ඉරි ඇදි පදය අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංග වලටද?

1.සන්ධි, තද්ධිත,සමාස 2.සමාස, සන්ධි, තද්ධිත

3.සන්ධි, සමාස, තද්ධිත 4.තද්ධිත, සන්ධි, සමාස

5. සමාස, තද්ධිත, සන්ධි (........ )

15.සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූපය සහිත වරණය තෝරන්න.

1.රවමින්, කියවමින්, පුරමින්, දහමින්

2.පිසුණේය, හැඩුවේය, බැලුණාය, සැදුණේය

3.අස, ගනු, බල, සාදවයි

4.රැක,බැස,ඉස, සිඹ

5.ලැබුහ, බිඳුණෝය, සිඳුණි, ගැයූහ (........ )

16.සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1.සරාසඳ, මව්කිරි, ගිනිබිය, ගවපල්

2.දසබල, තාරපති, තිනෙත්, විදුරව්

3.දිගුවරල,සඳවත,තුන්බිය,රජකුමරු

4.රන්රිදී, දුකසැප, අක්කානගෝ, අතපය

5.සත්වකරුණාව, මැටිබඳුන්, කෘමිහානි, වේපස් (........ )

17.එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1.නිලුපුල්, අතිනත, මිණිබරණ, පිනැති 2.මුදලිඳු , රුවනාර, බුදුකුරු, ගුරුතුමා

3.දුන්න, වැද්දා, කුරුල්ලා, ගාල්ල 4.තප්පර, කොග්ගල, අත්සන, පලාපල, වක්කඩ

5.නියංසාය, ළිංවතුර, නෙළුම්මල්, සුවාසූ, කළංදෙක (........ )

18. ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

1.ඖචිත්‍ය, තාරුණ්‍ය, සාමර්ථ්‍ය, සෞන්දර්ය

2.හත්දවස,මග්ගොන, ලග්ගල, දූප්පත්

3.දරිද්‍රතා, විරෝධතා, විශේෂතා, ප්‍රවීණතා

4.වගේ, අයුරු, මෙන්, ගිය

5.පටුචේතනා, සුළුජාතීන්, දිගඋමග, නිලරථය (........ )

19. ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

1.රියදුරන් විසින් ට්‍රක් රථ ධාවනය කරන ලදී.

2.ශිෂ්‍යයෝ විභාගයට සූදානම් වී නැත.

3.මිනිස්සු පැමිණියහොත් අපි රැස්වීම පවත්වමු.

4.ළමයෙක් වැඩිහිටියනට පහර දුන්හ'යි මම නො අදහමි.

5.අද බාලයෝ ලෙස නොහැසිරෙව්. (........ )

20.ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1.ගමනට තව කොච්චර දුරද?
2.මම කඩේට ගිහින් එන්නම්කෝ.
3.මොකක්ද ළමයෝ ඔය වෙලා තියෙන්නේ.
4.අපි ළමයින්ගේ හොද වැඩවලට සලකමු.
5.රෝහල් සේවකයෝ ඒ අවස්ථාවේ යුහුසුළුව කටයුතු කළහ. (........ )

ලකුණු 20

11 කොටස

- මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 4කට පමණක් පිළිතුරු සපයන්න.

2.(අ) පහත සදහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ලේඛන ඉතිහාසයේ අවසන් අදියරේදී අක්ෂර ලිපිය නිපදවාගත් මිනිසාගේ අරමුණ වූයේ ලේඛනය මගින් කථා ශබ්ද විශ්වසනීය ලෙස නියෝජනය කොට දැක්වීම යයි කීම ඇත්තක් විය හැකි වුවද එම අරමුණ සාකල්‍යයෙන් ඉටුකර ගත් භාෂක සමාජයක් කිසි කලෙක හෝ වූ බවට සාධක නැත. බොහෝ භාෂාවල ලේඛනයත් භාෂණයත් අතරෙහි වෙනස්කම් දක්නට ඇති අතර සෑම භාෂාවකම පාහේ ලේඛනයත් එය කියවන ස්වභාෂිකයාගේ ශබ්දෝච්චාරණයත් අතරෙහි වැඩි අඩු වශයෙන් එකට එක නොගැළපෙන තැන් දක්නා ලැබේ. එක් භාෂක සමාජයක වැඩි පැවති ලිපියක් වෙනත් භාෂක සමාජයකට අයත් භාෂාවක් ලිවීම සදහා යොදා ගැනීමේදී ඇති වූ ගැටලු එබදු නොගැළපීම් වලට එක් හේතුවක් විය. සාම්ප්‍රදායික ලේඛනයක් සහිත භාෂා කෙරෙහි වෙසෙසින් බලපෑ තවත් හේතුවක් ඇත. එනම් පරපුරෙන් පරපුරට, වසරින් වසරට ආ විසින් ඉක්මනින් වෙනස් වන ජීව භාෂාවක් භාෂණය හා සමගාමීව ලේඛනය වෙනස් නොවීමයි.

සාම්ප්‍රදායික ලේඛනය කියවන ස්වභාෂිකයාගේ ශබ්දෝච්චාරණ ක්‍රමය කෙරෙහි ඔහුගේ සමහර භාෂණ පුරුදු ද බලපානා හෙයින් ලේඛනය හා කියවීම අතරෙහිද එකකට එකක් නොගැළපෙන තැන් ඇතිවීමට එය හේතුවක් වෙයි. ලිඛිත ව්‍යවහාර කථික ව්‍යවහාර දෙක අතරෙහි නිරායාසයෙන් ඇති වන ඉහත කී පරතරය ඇතැම් භාෂා විසින් අඩු කරගන්නේ යුගයෙන් යුගයට කලාතුරකින් කරන ලේඛන ප්‍රතිසංස්කරණ මගිනි.

1. කථා ශබ්ද නියෝජනය පිණිස ලේඛනය මගින් මිනිසා නිපදවාගත් මාධ්‍යය කුමක්ද?
2. අක්ෂර නිපදවා ගැනීමෙන් මිනිසාගේ අරමුණ වූයේ කුමක්ද?
3. බොහෝ භාෂාවල දක්නට ලැබෙන ප්‍රභේද දෙක ලේඛකයා හදුන්වන්නේ කවර ලෙසකින්ද?
4. ලේඛනයත් ශබ්දෝච්චාරණයත් අතර වෙනස්කම් ඇතිවීමට ලේඛකයා දක්වන හේතු 2 දක්වන්න.
5. ජීව භාෂාවක මූලික ලක්ෂණය ලියන්න.
6. ලේඛන ප්‍රතිසංස්කරණ මගින් බලාපොරොත්තුවන්නේ කුමක් ද?

(ලකුණු.12 යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාවද සඳහන් කරන්න.

කිසියම් ජනතාවකගේ සංස්කෘතිය ඒ ජනතාවගේ පැවැත්මට සමගියට සන්තෘෂ්ටියට අදාළ වේ නම් ඒ ඒ සංස්කෘතිය ඒ ජනතාවට හොඳය. සිංහල ගැමි ජනයාගේ පැවැත්මට, සමගියට,සන්තෘෂ්ටියට අදාළ වන සංස්කෘතියක් ඔවුන්ට ඇත. අමන ඇදහිලි සිරිත් මෝඩ විශ්වාස ආදියෙන් තොර වුවත් ඔවුන්ගේ ඒ සංස්කෘතිය එකිනෙක හොඳින් ගැලපී සිටින සමාජ ධර්මාවලියකි. නාගරික සභ්‍යත්වය නවීන විසිතුරු අංගයන්ගෙන් හා සංකීර්ණ සිරිත් විරිත් වලින් යුක්ත වෙයි.එහෙත් එය ගැමි සංස්කෘතිය අනායාසයෙන් එකට ගැළපුණු සමාන අංගයන්ගෙන් සැදුණු සංස්කෘතියක් නොවේ. එකිනෙක හා ගැළපෙන්ට සටන් කරන නව අංග බහුල නාගරික සංස්කෘතිය අනවරතයෙන් සිදුවන කලහය ඇති තැනකි.
නාගරික සංස්කෘතිය කෙතරම් විසිතුරු වුවත් නවීන වුවත් දැනුමෙන් හා බුද්ධි මහිමයෙන් උසස් වුවත් කිසිවෙකු එහි පිහිටා ගැමියන්ට සුදුසු නුසුදුසු දේ විනිශ්චය කිරීම වැරදිය.නාගරිකයන්ට සුදුසු දේ වග විභාගයක් නැතිව ගම්වලට ගෙන ගොස් ගැමියන් අතර ප්‍රචාරය කිරීම වැරදිය.කලාව නවීන බව බුද්ධිය යන මොවුන්ගේ නාමයන් පොදුවේ සිනමා සිත්තම් දැකීමෙන් ගැමියන් දූෂණය කොට ඔවුන් විනාශ කරන්නට ඉඩ නොතැබීම නිදහසට පටහැනි ක්‍රියාවක් නොවේ. ගැමි වහර, සංස්කෘතිය වෙනස් වන්නේ සෙමිනි. ඔවුන් අතර උගැන්ම හා අර්ථය දියුණු වන සැටියෙන් හා නවීන දේ ඉවසන්නට ඔවුන් කෙමෙන් පුරුදු වන සැටියෙන් ද ඔවුන්ගේ සංස්කෘතිය සකස් වෙයි. ඒ සකස් වීම නිසා ගැමි සංස්කෘතිය නාගරික සභ්‍යත්වයෙහි ඇතැම් නවීන විසිතුරු දේ සෙමෙන් උකහා ගෙන ගළපා ගනියි.ඇතැම් දේ බැහැර කරයි.මෙසේ විකාශනය වෙමින් සෙමෙන් වෙනස් වන ගැමි සංස්කෘතිය ගැමියන්ගේ සමගිය සන්තෘෂ්ටිය සන්සුන් බව රකිමින් ආචීර්ණකල්පිත සිරිත් කෙමෙන් වෙනස් කරයි.

(ලකුණු.13 යි)

3. ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

I. ගෝලීය ආර්ථිකය හා වසංගත රෝග
II. සංස්කෘතිය හා දේශීය අනන්‍යතාව
III. අධිවේගී මාර්ග ඉදිවීම රටේ සංවර්ධනයට වන බලපෑම
IV. සංස්කෘතික ත්‍රිකෝණයෙන් මතුවන යටගියාව
V. මානව වර්ගයාගේ අනර්ථයට හේතුවන නවීන විද්‍යාව
VI. වගකීමෙන් තොර නිදහස සමාජයට අහිතකර වේ.

(ලකුණු.25 යි)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. බොහෝ වගකීම් ඉටු කළ ද අපි වරප්‍රසාද ලබා නැත.
2. මම ඒ උත්සව අවස්ථාවට වාර්තාකරුවෙක් ලෙස පෙනී සිටියෙමි.
3. ක්‍රීඩකයන් සමග ක්‍රීඩිකාවෝ ද සංදර්ශනය සඳහා ක්‍රීඩාංගනයට පැමිණියහ.
4. සභාපතිතුමා විසින් සභිකයන් අමතනු ලබති.
5. අනාගත නායකයෝ ප්‍රඥාවන්තයන් වෙත්වා. (ල.1 ×5=5)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

1. පැරණි සිංහල රජවරු පාලි සංස්කෘත පොත් පවා සිංහලයට පරිවර්තනය කළහ.
2. භාෂා රිතීහු නව සම්ප්‍රදායන් බිහි කරති.
3. රාහුල හිමියෝ පරෙවි සංදේශය රචනා කළහ.
4. වෙළෙන්දෝ අධික මිලට භාණ්ඩ විකුණති.
5. ප්‍රවීණ මාධ්‍යවේදියෙක් මහත් හරසරින් මා පිළිගත්තේය.

( ල.1 ×5=5)

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. දැව (ජාවාරම්කරුවෝ/ ජාවාරම්කරුවන්) වටිනා (වෘක්ෂයෝ/ වෘක්ෂයන්) කපා හෙළති.
2. (ගංගාවෝ/ ගංගාවන්) වියළි යද්දී (මිනිස්සු/ මිනිසුන්) දෙවියන් යදිති.
3. විදේශගත වූ (නෑදැයෝ/නෑදැයන්) මෙරටට පැමිණෙති යි මගේ (මිතුරෙක්/මිතුරෙකු) පැවසීය.
4. දක්ෂ (කිවිදියක්/කිවිදියක) වූ නිර්මලා ප්‍රවීණ (ගායිකාවක්/ගායිකාවක) ද වූවා ය.
5. (ගැමියන්/ගැමියෝ) විසින් (අපි/අප) සාදරයෙන් පිළිගනු ලද්දෙමු.

(ල.1 ×5=5)

5.පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායේ අනු අංගය දක්වන්න.

1. **මව්පිය** ආරක්ෂාව මෙන් ම දේව ආශිර්වාදයත් අපට **ලැබේවා!**

   (මව්පිය- සමාස, ම - නිපාත, වේවා - ක්‍රියා)

2. වැසි **වසිද්දී සුළඟින් සෙළවුණු** මහා වෘක්ෂයෝ බිම පතිත වූහ.

   (වසිද්දී - ක්‍රියා, සුළඟින් -විභක්ති, සෙළවුණු - කෘදන්ත)

3. **සිල්වත්හු** තම **දෑඟිලි** එක් **කරමින්** දොහොත් මුදුන් දී වන්දනාමාන කළහ.

   (සිල්වත්හු - තද්ධිත, දෑඟිලි -සන්ධි, කරමින් - ක්‍රියා)

4.**ගායකයාණෝ** පහන් ටැබක් **සේ** ශාලාවෙහි සියල්ලෝම **මිහිරිතම** ගීයක් ගයා සතුටු කළහ.

   (ගායකයාණෝ - තද්ධිත, සේ - නිපාත, මිහිරිතම - තද්ධිත)

5.හමුදා **නිලධාරීන්ගේ** කැපවීම **නිසා** වෛරසය **පැතිරුණු** ප්‍රදේශ සාර්ථකව නිරෝධායනයට ලක් කිරීමට හැකි වූ බව වාර්තා විය.

   (නිලධාරීන්ගේ - විභක්ති, නිසා - නිපාත, පැතිරුණු - කෘදන්ත)

(ල. 3×5=15)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරින් තෝරා ලියන්න.

1. නූතන කවීහු .........................භාවිතා කිරීමෙහිලා දක්ෂයෝය.
2. ශිෂ්‍ය .....................ඔප් නැංවීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය විය යුතුය.
3. පුද්ගල.....................ගොඩනැගීමට තම පවුල් පසුබිම ද ඉවහල් වේ.
4. ජාත්‍යන්තර.........................රටක පැවැත්මට අත්‍යවශ්‍ය වේ.
5. නිදහස් දින සැමරුම් ........................නිදහස් චතුරස්‍රයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විය.

(කුසලතා, අලංකාර, පෞරුෂය, ප්‍රධානෝත්සවය, සම්බන්ධතා)

(ල. $1/_2 \times 6 = 3$)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

I. ලංකා + ආලෝකය
II. බුද්ධ + උප්පත්තිය
III. නීති +අනුකූල
IV. උන් + උන්
V. නාට්‍ය + උචිත
VI. සිලිල් + ආර

(ල. $1/_2 \times 6 = 3$)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

1. **උතුමෝ වැසියනට** සෙත සදති.
2. **කුමරියගේ කට හඬ** ඉතා මිහිරිය.
3. **දරුව, කුමක් සඳහා** අඬන්නෙහිද?

(ල. $1/_2 \times 6 = 3$)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

1. මිනිසුන් යුද වදින්නේ ඇයි ඔහු පැවසුවේ එපමණකි
2. පාලි සාහිත්‍යයෙහි සමනොළ කන්ද හැඳින්වූයේ සමන්තකූට යන පදයෙනි.
3. උත්සවය ආරම්භ වූයේ ප ව 7:30 ට ය

(ල. $1/_2 \times 6 = 3$)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

1."අපි තරගය ජයග්‍රහණය කරන්නෙමු" යි ක්‍රීඩකයෝ පැවසූහ.
2. "වසංගත උවදුර තුරන් කළෙමු" යි සෞඛ්‍ය බලධාරීහු අදහස් පළ කළහ.
3. "අපි හෙට පාසලේ සම්මන්ත්‍රණයට සහභාගී වන්නෙමු" යි සියලු ශිෂ්‍යයෝ පොරොන්දු වූහ.

(ල.1×3=3)

7.පහත සඳහන් ජේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

උත්තම ගණයේ කාව්‍යයක කාල, දේශ, භාෂා ආදී සීමාවන් අභිබවන සාර්වත්‍රික ලක්ෂණ අන්තර්ගත වීම අපේක්ෂා කෙරේ.එවැනි කාව්‍යයකින් විශ්ව සාධාරණ රුචිකත්වයක් ද අපේක්ෂා කෙරේ. **එංගලන්තයේ** හෝ **රුසියාවේ** හෝ භාරතයේ හෝ **ලංකාවේ** හෝ කවර යුගයකට හෝ වේවා අයත් කෘතියක් කියවා අපට රස විඳිය හැකි වනුයේ එහෙයිනි.ඒ කාව්‍ය ලෝක සිතියමේ අබැටක් තරම් වූ කුඩා ලංකාවේ වෙසෙන සිංහල පාඨකයාට කියව කියවා ස්වකීය අත්දැකීමක් බවට පත්කර ගැනීමට පුළුවන. ඒ කාව්‍යයෙහි ඉදිරිපත්වන චරිතයන්ට ඔවුන් මුහුණ දෙන ගැටලුවලට තමාට ද පිවිසිය හැකිවනු ඇත. එහෙත් මෙවැනි කෘති පහළ වනුයේ කලාතුරකිනි.

මෙහි අනෙක් පැත්තක්ද ඇත්තේය. **සිත්තරා** සිතුවම් ඇඳීම සඳහා සායම් වර්ග උපයෝගී කරගන්නා සේම කවියාගේ උපකරණය නම් භාෂාවයි. ඒ වචනවල ඇති විවිධ අරුත් ඔහු ප්‍රයෝජනයට ගනියි. මේ වචන කාලයට, දේශයට, භාෂාවට අනුව වෙනස් වෙනස් අරුත් ගැනීම ස්වභාවයකි. කාලය, දේශය, භාෂාව පමණක් නොව ඒ ඒ පුද්ගලයාගේ රුචිය හා ගතිය අනුව ද වචනවල අර්ථ වෙනස් වේ. කවියා යොදන වචනවල නියම අර්ථ තේරුම් ගැනීමට නම් ඒ කෘතිය පහළ වූ සංස්කෘතික පසුබිම පිළිබඳ අවබෝධයක් තිබීම අවශ්‍යයි. කාව්‍යයක් රස විඳීමේදී එයට වස්තු වන ජනයාගේ ජීවිතය පිළිබඳ අවබෝධයක් ද තිබිය යුතුය යන්න ඇතැම් විචාරකයන් නොරුස්සන්නකි. එය පහළ වූ අවධියේ **සාහිත්‍යය** පිළිබඳ කවර නම් මතිමතාන්තර පැවැත්තේද, කවර නම් සිද්ධාන්ත බල පැවැත්තේද යන කරුණු පිළිබඳ ව **විචාරකයා** කුහුලක් දැක්විය යුතුය යන්නත් ඇතැම් විචාරකයන් නොරුස්සන්නකි.

I. ජේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

II. රුචිකත්වය, සීමාවන් කෘතිය යන වචනවල යෙදී ඇති පිළිවෙත වෙනම ලියන්න.

III. ඉහත ජේදයෙන් උපුටා දක්වන්න.

1. අඝෝෂ,දන්තජ, අල්පප්‍රාණ,ව්‍යංජනයක් හා යංශය සහිත වචනයක්
2. රකාරාංශය හා ඝෝෂ තාලුජ ව්‍යංජනයක් සහිත වචනයක්
3. නාසික්‍ය අක්ෂර තුනක් හා අන්තඃස්ථ අක්ෂරයක් සහිත වචනයක්

iv. පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

අබැටක්, සිතුවම්, මතිමතාන්තර

v.පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ජේදයෙන් උපුටා දක්වන්න.

පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා(වර්තමානකාල ඒක වචන), මිශ්‍ර ක්‍රියා

(ල.3 ×5= 15)

8.පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

1. ද කාරාර්ථ සමාසය
2. මිශ්‍ර ක්‍රියා
3. ස්වර සන්ධිය
4. ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යයෝ
5. අන්තඃස්ථාක්ෂර (ල. 3 ×5= 15)